# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1372 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 01/11/2023<br>පැය 1730 |

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තැබීමකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2023.10.31 වන දින රාත්‍රි කාලයේ කඳාන පොලිස් වසමේ දෙල්ගොඩ ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් ග්‍රෑම් 20 මිලිග්‍රෑම් 400 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කඳාන පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වූ නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**මෙම පුද්ගලයා සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ සමීපතමයෙකු වන දැනට ඩුබායිහි රැඳී සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ මෙරට මත්ද්‍රව්‍ය බෙදාහරින පුද්ගලයෙකු බවටත්, ආරක්ෂක අංශයකට අනුයුක්තව රාජකාරි කල අයෙකු බවටත් සිදුකරන ලද විමර්ශනයේ දී අනාවරණය වී ඇත. තවද 2023.08.04 වන දින කඳාන පොලිස් වසමේ පිහිටි නිවසකට යතුරුපැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමට තැත්කිරීමට අදාලව වෙඩි තැබීමට යොදාගත් ගිනි අවිය වෙඩි තැබීමට පෙර රැගෙන ඒම, ගිනි අවිය සඟවා තබා ගැනීම, වෙඩික්කරු හට අවිය ලබා දීම, වෙඩික්කරු හා ගිනි අවිය වෙඩි තැබූ ස්ථානයට ප්‍රවාහනය කිරීම, වෙඩි තැබීමෙන් පසු ගිනි අවිය සැඟවීම, වෙඩි තැබීමෙන් පසු වෙඩික්කරු හට මෙරටින් පිටවීමට ආධාර අනුබල දීම, මනුෂ්‍ය ඝාතනයට තැත්කිරීමට ආධාර අනුබල ලබාදීම සිදුකර ඇති බවටද අනාවරණය වී ඇත.**

කඳාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**